# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2141/81 - 2019 සැප්තැම්බර් මස 20 වැනි සිකුරාදා - 2019.09.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(X)(A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය අ. ඉබතුල් රවුෆ් හකීම් වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන ලියාපදිංචි අංක පී. වී. 72548 දරන සීගිස් කැම්පත් (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් ඉහත කී විශ්වවිද්‍යාල පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසු, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ සහ 2018 ජූලි මස 11 වන දින අංක 2079/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ, II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන ''තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම මෙහි II උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

**I වන උපලේඛනය**

*කොන්දේසි*

නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (05) සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධිය පිරිනැමීම සඳහා සීගිස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් හඳුනාගනු ලැබේ.

සීගිස් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින්, ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය සම්බන්ධයෙන් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි වැඩසටහන සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී වාණිජ්‍ය විෂය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ; හෝ

(ආ) නිශ්චිත බලධරයා මගින් අනුමත කරන ලද හේයම් පාඨමාලාවක් සහිතව, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවකින් සාමාන්‍ය සාමාර්ථ (S) තුනක් (03) එකවර ලබා තිබීම,

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම ලබා තිබීම යන්නට අනුකූල විය යුතු ය.


1A - PG 4650 — 517(2019/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය පිළිබඳ කෙටි යෙදුම* |
|---|---|
| ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය | බී.බී.ඒ |

අ. ඉබතුල් රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජලසම්පාදන හා
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

10 - 139